## වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීම සඳහා අතිරේක මූල්‍යයනය ව්‍යාපෘතිය - 2015

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීම සඳහා අතිරේක මූල්‍යයනය ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංසං) අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹී අංක 5445 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ පොදු කොන්දේසිවල 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජල සම්පත් මණ්ඩලය, පලාත් සභා හා ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. විශාල වේලි මෙහෙයුම් හා නඩත්තු කිරීම සහ ජල සම්පත් සැලසුම් වැඩි දියුණු කිරීම සඳහා දීර්ඝ කාලීන තිරසාර සැලසුම් ස්ථාපිත කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 11,036.91 කට සමාන එජඩො මිලියන 84.5 ක් වූ අතර ඉන් රු.මිලියන 10,841.5 කට සමාන එජඩො මිලියන 83 ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ඔක්තෝබර් 23 දින ආරම්භ කරන ලද අතර 2018 මැයි 15 වන විට නිම කිරීමට නියමිතය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කළමනාකරණයේ වගකීම වේ.

### 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු

කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඔ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------------

**2.1 මතය**

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු යන බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 3.2 වගන්තිය අනුව, රාජ්‍ය අංශයේ අනියුක්ත ආයතන වලින් නිදහස් කරනු ලබන ප්‍රදාන අරමුදල් සපයන ව්‍යාපෘතිවල නිලධාරීන්ගේ සේවා කාලය වසර 05 කට සීමා විය යුතුය. කෙසේ වෙතත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් මුදා හරින ලද නිලධාරීන් නව දෙනෙකු ව්‍යාපෘතිය විසින් වසර 05 කට වැඩි කාලයක් සේවයේ යොදවා ගෙන තිබුණි.

### 2.2.2 ව්‍යාපෘති අරමුණු වලින් බැහැරව උපයෝජනය කළ අරමුදල්

වෙනත් ප්‍රදාන අරමුදල් සපයන ව්‍යාපෘතිවල නියුතු චීන ඉදිකිරීම් සමාගමක් මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ නිලධාරින් 14 දෙනෙකු සඳහා 2015 ජූලි 27 සිට අගෝස්තු 01 දක්වා චීනයේ අධ්‍යයන චාරිකාවක් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සංවිධානය කර තිබුණි. දින 07 න් දින 03 ක් දැකුම්කළු ස්ථාන බැලීමට යාම හා භාණ්ඩ මිලදී ගැනීම් කටයුතු ආදිය සඳහා ගතකර තිබීම් හේතුවෙන් වෙන් කරන ලද කාලය හා රු. 980,750 ක් වූ අමතර දීමනා ගෙවීම් ඇතුළුව ඒ සඳහා වැය කළ රු. මිලියන 2.83 ක පිරිවැය, දැනුම සහ අත්දැකීම් අත්කර ගැනීම මඟින් ව්‍යාපෘතියේ අරමුණ ඵලදායීව ඉටුකර ගැනීමට යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංසං | 83.00 | 10,841.50 | 1,910 | 13.89 | 1,935.02 | 15.04 | 2,049.31 |
| ශ්‍රීලංර | 1.50 | 195.41 | 40 | 0.04 | 4.49 | 0.04 | 4.49 |
| | **84.50** | **11,036.91** | **1,950** | **13.93** | **1,939.51** | **15.08** | **2,053.80** |

## 3.2 භෞතික ප්‍රගතිය

2006 මාර්තු 16 දිනැති ණය අංක කිවු 5200 යටතේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් 2015 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතියේ දීර්ඝ කිරීමක් ලෙස වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ අතිරේක මූල්‍යයනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) <u>වේලි ආරක්ෂණ සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින ජලාශ 14 ක, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින ජලාශ 04 ක හා ලංකා විදුලිබල මණ්ඩලය යටතේ පවතින ජලාශයක වේලිවල පිළියම් වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණු නමුත් ඒ වෙනුවෙන් 2015 වර්ෂය සඳහා රු. මිලියන 720 ක වෙන්කිරීමක් කර තිබුණි. තවද, 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින මාලින්ද වැව හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පවතින අඹගහගම වැව හා පානක්කානිය වැව් යන වැව් වේලි වල පිළියම් වැඩ පසුව මූලික සැලැස්මෙන් ඉවත් කර තිබුණි.

(ii) ජාත්‍යන්තර වේලි ආරක්ෂණ ප්‍රමිත වලට අනුව, වසර 20 සිට 30 දක්වා කාල පරාසයක් තුළ අනිවාර්යයෙන්ම සිදු කිරීමට නියමිත පොල්ගොල්ල උමඟ සම්බන්ධයෙන් පිළියම් වැඩ නියං කාලය තුළ උමඟ වැසීම මඟින් පොදු ජනතාවට මුහුණ පෑමට සිදුවිය හැකි අපහසුතාවයන් හේතුවෙන් වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ පළමු ව්‍යාපෘතිය යටතේ සිදු කර නොතිබුණි. කෙසේ වෙතත් අදාළ කටයුතු සිදු කිරීමට විකල්ප

මාර්ගයන් සලකා බැලීමකින් තොරව රේඛීය අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය යටතේ අදාළ වැඩ සඳහා ඉල්ලුම් කළ වෙන්කිරීමද ආපසු ලබා ගෙන තිබුණි.

(iii) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් කිරීමේ පළමු ව්‍යාපෘතියෙන් මාරු කළ දත්ත එක්රැස් කිරීම හා ප්‍රදර්ශන පද්ධතිය හා භූමිකම්පා නියාමනය හා අනතුරු කලින් ඇඟවීමේ පද්ධති සඳහා කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන නොතිබුණු අතර ඒ සඳහා සිදු කළ රු. මිලියන 80 ක වෙන්කිරීමද උපයෝජනය කර නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් සිදු කළ පැහැදිලි කිරීමට අනුව, දත්ත එක්රැස් කිරීම හා ප්‍රදර්ශන පද්ධතිය ක්‍රියාත්මක කිරීම මහවැලි ජල ගැලීම් නියාමනය මෙහෙයුම් හා ජලාශ පාලන මධ්‍යස්ථානය විසින්ද භූමිකම්පා නියාමනය හා අනතුරු කලින් ඇඟවීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම භූ විද්‍යා හා පතල් කාර්යාංශය විසින්ද සිදු කිරීමට සැලසුම් කරන ලද බැවින් ව්‍යාපෘතිය විසින් අදාළ කටයුතු ක්‍රියාත්මක නොකරන ලදී.

**(ආ)** <u>බහු ආංශික ජල සම්පත් සැලසුම්කරණය</u>

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ පළමු ව්‍යාපෘතියේ 03 සංරචකය යටතේ සකස් කරන ලද ජල භාවිත සැලසුම් 03 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සිදු කිරීමට නියමිත ශක්‍යතා අධ්‍යයන මෙම ව්‍යාපෘතිය වෙත මාරු කර තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් අදාළ කාර්යය 2016 අප්‍රේල් 30 දින වන විටත් සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය සඳහා ඒ වෙනුවෙන් සිදු කළ රු.මිලියන 13 ක වෙන්කිරීමක් උපයෝජනය කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිණිපේ අන්තර් නිම්න ද්‍රෝණි ඇළ මාර්ගය පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 300.54 ක් වුවත් අදාළ කොන්ත්‍රාත්තුව රු.මිලියන 430.84 කට තෙවන අඩුම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට පිරිනමා තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ පැහැදිලි කිරීමට අනුව පෙර කොන්ත්‍රාත්වලදී ලංසුකරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් රු.මිලියන 423.28 ක දෙවන අඩුම ලංසු මිල ප්‍රතික්ෂේප කර තිබුණි. කොන්ත්‍රාත්තුව යටතේ පුනරුත්ථාපන වැඩ 2015 දෙසැම්බර් 31 දිනට සියයට 31 ක අඩු ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණද එදිනට සියයට 59 ක ප්‍රගතියක් ඉටු කර ගැනීමට අපේක්ෂා කර තිබුණි.

(ආ) තබ්බෝව සහ තේවනුවර ගම්මාන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන තබ්බෝව ඇළ ඉහළින් නව පාලමක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් රු. මිලියන 14.75 ක පිරිවැයකට 2013 නොවැම්බර් 26 දින පිරිනමා තිබුණි. කෙසේ වෙතත් වැඩ වල විෂය පථය අඛණ්ඩව වෙනස් කර තිබුණු අතර රු.මිලියන 5.71 ක් වටිනා විචලන නියෝග 08 ක් 2015 දෙසැම්බර් 31 දිනට අනුමත කර තිබුණි. තවද, වැඩ වල විෂය පථයේ වෙනස් කිරීම් වල ප්‍රතිඵලයක් ලෙස හියුම් පයිප්ප 90 ක් වැඩ බිමේ නිෂ්කාර්යව

පැවතුණි. රු.මිලියන 2.57 ක් වටිනා හියුම් පයිප්ප පිරිවැය ප්‍රතිපූර්ණය කිරීමට කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ ඉල්ලීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය අධ්‍යක්ෂක විසින් 2015 ජූලි 10 දින අනුමත කර තිබුණි.

(ඇ) තබ්බෝව ජලාශයේ වාන් දොරටු 20 ක රැහැන් අළුතින් දැමීම හා නවීකරණය සඳහා කොන්ත්‍රාත්තුව රු. මිලියන 2.31 ක පිරිවැයකට 2015 මාර්තු 19 දින පිරිනමා තිබුණු අතර 2016 මැයි 17 දිනට එයින් වාන් දොරටු වල රැහැන් 05 ක් කැඩී ඇති බව වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස වාන් දොරටු භාවිතය පිළිබඳ විශ්වාසය සම්බන්ධයෙන් අවදානම පිළිබඳ විගණනයේදී බැහැර කළ නොහැකි විය. තවද, තබ්බෝව ජලාශයේ බැම්මේ අක්පා පෙරහනක් (toe filter) හා අක්පා කාණුවක් (toe drain) ඉදිකිරීමට කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 37.63 ක්ද ගෙවා තිබුණි. කෙසේ වෙතත් ජලාශයේ බැම්මේ මීටර 100 ක් සඳහා එවැනි ව්‍යුහයක් කොන්ත්‍රාත්කරු සකස් කර නොතිබුණු අතර ප්‍රතිඵලයක් ලෙස ජල කාන්දුවීම් මැණීම් සඳහා අරමුණ විධිමත්ව ඉටු වී නොතිබුණි.

**3.4 පරිබාහිර කාර්යයන්**

-----------------------

ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වලට අයත් සංචාරක බංගලා 09 ක් අළුත්වැඩියාව වෙනුවෙන් රු.මිලියන 14.46 ක් ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති අරමුණු වලට පටහැනිව ණය අරමුදල් වලින් වැය කර තිබුණි.

**3.5 නිෂ්කාර්ය වත්කම්**

----------------------

පුහුණු ශ්‍රමිකයින් නොමැති වීම හේතුවෙන් රු.මිලියන 91.2 ක පිරිවැයකට ජලයේ ගුණත්වය මැණීමේ කාර්යය වෙනුවෙන් ප්‍රසම්පාදනය කළ රසායනාගාර උපකරණ, ඒ වෙනුවෙන් ඉදිකරන ලද ගොඩනැගිලි හා සංවර්ධනය කරන ලද මෘදුකාංග 2015 දෙසැම්බර් 31 දිනට නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

**3.6 මූල්‍ය පාලනයේ ගැටලු**

---------------------------

අදාළ වත්කම්වල ස්ථානගත වීම හඳුනාගැනීමේ ගැටලු හේතුවෙන් රු. මිලියන 304.68 ක් වටිනා ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි. තවද, 2015 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නොමැතිවීම් හේතුවෙන් එම ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම නිවැරදිව සත්‍යාපනය කළ නොහැකි විය.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

ව්‍යාපෘතිය විසින් වයස අවුරුදු 60 ඉක්ම වූ ගණකාධිකාරිවරයෙක් කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයේ වැරදි තොරතුරු ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය.